# වම්බටු වගාවේ ක්ෂේත්‍ර සනීපාරක්ෂාව තුළින් පළිබෝධ කළමනාකරණය



වම්බටු වගාවට හානි සිදු කරන කරටි සහ ගෙඩි විදින්නන්, යුෂ උරා බොන පළිබෝධකයන් මෙන්ම දිලීර සහ බැක්ටීරියා රෝග ආසාදනය මගින් සිදුවන හානි මගින් වම්බටු අස්වැන්නේ ප්‍රමාණය සහ ගුණාත්මය සැලකිය යුතු ලෙස අඩුවේ. මෙම රෝග හා පළිබෝධ හානි පාලනය කිරීම සඳහා ගොවි මහතුන් පමණ ඉක්මවා රසායනික පළිබෝධනාශක භාවිතා කරයි. එමඟින් පරිසරයට සිදුවන බලපෑම්, සෞඛ්‍ය අවදානම් ඇති වීම සහ පළිබෝධනාශක ප්‍රතිරෝධී පළිබෝධකයින් ඇති වීම ආදිය සිදුවිය හැක. එබැවින් ක්ෂේත්‍ර සනීපාරක්ෂණ ක්‍රම යොදා ගැනීම් තුළින් පළිබෝධනාශක යොදන වාර ගණන අඩු කර ගැනීමටත්, එයින් උපරිම ප්‍රතිඵල ලබා ගැනීමටත් හැකිවේ.

## මුලික ක්ෂේත්‍ර සනීපාරක්ෂක ක්‍රියාකාරකම්

### 1. නිරෝගී තවාන් පැළ ලබා ගැනීම

- **තවාන සඳහා යෝග්‍ය ස්ථානයක් තෝර ගැනීම** - හොඳින් ජල වහනය සිදුවන (ජලය රැඳී පවතින තත්ත්වයක් නොමැති) හොඳින් හිරු එළිය වැටෙන සාරවත් වැලි ලෝම් පසක් තෝරා ගන්න.
- **උස් පාත්ති සැකසීම** - උස සෙන්ටිමීටර් 15- 20 ක් පමණ වන, මීටර 1 ක් පළලින් යුක්ත වන තවාන් පාත්ති සකසා ගන්න.
- **තවාන් ජීවනුහරණය කිරීම** - සාමාන්‍යයෙන් පසේ ව්‍යාධිජනක බැක්ටීරියා හා දිලීර පැවැතිය හැක. ඒ අනුව තවාන් පාත්ති නිසි ලෙස පිළිස්සීමෙන් ජීවාණුහරණය කර ගන්න.
- **නිරෝගී බීජ භාවිතා කිරීම** - රෝග ආසාදන වලින් තොර නිරෝගී බීජ භාවිතා කරන්න.

### 2. වගාව සඳහා ක්ෂේත්‍රය සැකසීම

- පෙර කන්නයේ සොලනේසියේ කුලයට අයත් බෝගයක් වගා නොකරන ලද ක්ෂේත්‍රයක් තොරා ගන්න.
- තෝරා ගන්නා ක්ෂේත්‍රයේ දැනට පවතින සියලුම බෝග අවශේෂ, වල්පැළ ඇතුළු දේ ඉවත් කොට හොඳින් පිරිසිදු කරන්න.
- සෙන්ටිමීටර 20 කට වඩා උස් පාත්ති සකසා ගන්න.

### 3. ගොවියා පිරිසිදුව සිටීම (පුද්ගලික සනීපාරක්ෂාව)

ක්ෂේත්‍රයේ කටයුතු ආරම්භ කිරීමට පෙර හා පසුව, සෑම විටම දෑත්, ඇඳුම් හා සපත්තු (පාවහන්) පිරිසිදු කර ගන්න.

### 4. උපකරණ සහ මෙවලම් පිරිසිදුව නඩත්තු කිරීම

එක් ගසක් සඳහා භාවිතා කළ කප්පාදු පිහිය, කියත හෝ කතුර වැනි උපකරණ, අනෙක් ගසක් කැපීම සඳහා යොදා ගැනීමට පෙර විෂබීජ නාශක දියරයකින් (chlorax වැනි) සෝදා පිරිසිදු කරන්න.



## 5. ආසාදිත ශාක කොටස් වගා ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීම

හානි වූ ශාක කොටස් (යුෂ උරාබොන කෘමීන් හානි කල, බටු කරටි හා ගෙඩි විදින්නා හානි කල, රෝග වැලදුන) ක්ෂේත්‍රයෙන් ඉවත් කොට විනාශ කරන්න.

## 6. බෝග අවශේෂ සහ වල්පැළ විනාශ කිරීම

වගා ක්ෂේත්‍රයට මදක් එපිටින් ද්‍රව්‍ය බැහැර කිරීමට වළක් කපා, ඉවත් කරන ලද බෝග අවශේෂ හා වල්පැළ දමා පුළුස්සා දමන්න. වර්ෂා කාලයකදී නම් වළ දමන්න.

## 7. ප්‍රයෝජනවත් නොවන පත්‍ර ඉවත් කිරීම

වම්බටු ශාකයේ ඇති වියළි පත්‍ර, කහ පැහැයෙන් යුක්ත පත්‍ර, පාදස්තයේ පත්‍ර (පාදයේ සිට සෙ.මී. 25-30 උසට ඇති) ඉවත් කරන්න.



## 8. නිසි පෝෂණය

මෙය මුලික ක්ෂේත්‍ර සනීපාරක්ෂණ ක්‍රමයක් නොවුව ද රෝග හා පළිබෝධ වලට පහසුවෙන් පාත්‍ර වීම වැළකීම සඳහා සහ හොඳ අස්වැන්නක් ලබා ගැනීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශයට අනුව නිසි ලෙස පොහොර යොදන්න.

## 9. කල්වේලා ඇතිව රෝග පළිබෝධ හානි හඳුනා ගැනීම

නිතිපතා ක්ෂේත්‍රය පරීක්ෂා කරන්න.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එක්ව ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක හා පොහොර ආරක්ෂිතව හා නිවැරදි ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් සකසන ලදී

2025 නොවැම්බර්